# 6. අප ජීවත් වන ප්‍රදේශය

තමා ජීවත්වන ප්‍රදේශය පිළිබඳ ව කරුණු දැන සිටීම සෑම පුද්ගලයෙකුට ම ඉතා වැදගත් වේ. තමා අවට ප්‍රදේශයේ ඇති සම්පත් හඳුනා ගැනීමත් ඒවා රැක ගැනීමත් පුරවැසි යුතුකමකි. එමෙන් ම අපට සේවා සපයන පුද්ගලයන් ආයතන හා සංවිධාන පිළිබඳ ව මනා අවබෝධයකින් සිටිය යුතු අතර ඒවායින් සැලසෙන සේවා ද හැඳින ගැනීම වැදගත් වේ.

## 6.1.1 පිහිටීම

5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වූ සනත්ටත්, රමේශ්ටත්, නසීර්ටත් නගරයේ උසස් පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව උදාවිය. පළමුවන දිනයේ ම මිතුරන් බවට පත් වූ ඔවුන් එකිනෙකා හඳුනා ගැනීමේ දී තම තමන්ගේ තොරතුරු ප්‍රකාශ කළේ මෙසේ ය.



''මම සනත්

මගේ ගම පිහිටා තිබෙන්නේ, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නක්කාවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කණන්ගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ය.''



''මගේ නම රමේශ්

මගේ ගම පිහිටා තිබෙන්නේ උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උරම්පුරම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ය.''



''මගේ නම නසීර්


මගේ ගම පිහිටා තිබෙන්නේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැණික්හින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ය.''

ඉහත දැක් වූ අවස්ථාවේ දී ඒ ඒ ශිෂ්‍යයන් විසින් තම ගම් ප්‍රදේශය ගැන තොරතුරු ඉදිරිපත් කොට තිබේ. අප ජීවත්වන ප්‍රදේශය හඳුන්වා දීමේ දී

▲ පළාත ▲ දිස්ත්‍රික්කය ▲ ග්‍රාම නිලධාරි කොට්ඨාසය යන කරුණු තුන වැදගත් වේ.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.





✤ **ශ්‍රී ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක දැක්වෙන සිතියමකි.**

ශ්‍රී ලංකාවේ සෑම ගමක ම ආරම්භය කුමක් හෝ වැදගත් සිදුවීමක් හා සම්බන්ධ වී තිබේ. ඇතැම් විටෙක එය ඉතිහාසය හා සම්බන්ධ සිදුවීමක් විය හැකි ය. නොඑසේ නම් කිසියම් සංවර්ධන ව්‍යාපාරයක් හේතුවෙන් බිහිවූවක් විය හැකි ය. ගමේ නම සෑදී ඇති ආකාරය විමසූ විට මෙම තොරතුරු සොයා ගත හැකි වේ.

**ක්‍රියාකාරකම 6.1.1.1**

- ගුරුතුමා/ගුරුතුමියගේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකාවේ සිතියමක ඔබ ජීවත් වන ගම අයත්වන පළාත සේයාකොට ගමේ දළ පිහිටීම (ආසන්න ලෙස) ලකුණු කරන්න.
- ඔබේ ගම ගැන නොදන්නා අයෙකුට නිවැරදි ව ඒ පිළිබඳ ව හඳුන්වා දෙන්න. (ජීවත් වන ප්‍රදේශය අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය, දිස්ත්‍රික්කය හා පළාත)
- තමා ජීවත් වන ගම හෝ නගරයේ නම සෑදුන අයුරු හා ඓතිහාසික වැදගත් කමක් ඇති තොරතුරු තිබේ නම් ඒවා ද ඇතුළත් කර ජීවන නිපුණතා සඟරාවට ලිපියක් සකස් කරන්න.

## 6.1.2 අප ප්‍රදේශයේ සම්පත් හඳුනා ගනිමු



ශ්‍රී ලංකාව සම්පත් බහුල රටකි. ඔබ අවට වටපිටාවේ ඇති ගහකොළ, ඇළදොළ, ගංගා කඳු ආදි සියල්ල සම්පත් ය. සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම් භෞතික සම්පත් හා මානව සම්පත් යනුවෙනි.

මිනිසුන් හැර ඔබේ ප්‍රදේශයේ ඇති අනෙකුත් සම්පත් භෞතික සම්පත් ය. ගංගා, දියඇලි, ගස්වැල්, ඛණිජ වර්ග, කඳු, වනාන්තර මේ සියල්ල අපට ප්‍රයෝජනවත් වේ.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ප්‍රදේශයේ සම්පතකි. එය මානව සම්පත වේ. ගොවීහු, ගුරුවරු, වෛද්‍යවරු, වඩු කාර්මිකවරු, මේසන්වරු, ඉංජිනේරුවරු ආදි විවිධ ක්ෂේත්‍රවල කටයුතු කරන අය ප්‍රදේශය තුළ ජීවත් වෙති. මේ විවිධ හැකියා සහිත විවිධ පුද්ගලයෝ ඔබේ ජීවිතය පවත්වාගෙන යාමට උදව්වෙති.



මැණික් පතලක දර්ශනයක්

**ක්‍රියාකාරකම 6.1.2.1**

- ඔබ ජීවත් වන ප්‍රදේශයේ පුද්ගලයන් වැඩි වශයෙන් නිරත ව සිටින රැකියාවන්ගේ ලැයිස්තුවක් සකස් කරන්න.
- ඔබ ප්‍රදේශයේ ඇති ස්වභාවික සම්පත් හඳුනාගෙන ඒවා කිසියම් කර්මාන්තයක යොදවා ඇත්දැයි විමසා බලන්න.

## 6.1.3 ප්‍රදේශයේ ආර්ථික කටයුතු



ලංකාවේ සෑම ප්‍රදේශයක ම ජීවත් වන ජන කොටස් තම ප්‍රදේශයේ ඇති සම්පත් උපයෝගී කරගෙන විවිධ කර්මාන්තයන්හි නිරත වෙති. මෙම කර්මාන්ත රටේ ආර්ථිකයට මනා දායකත්වයක් සපයයි.

රටේ අභ්‍යන්තර තැනිතලා ප්‍රදේශයේ ජීවත් වන පිරිස් කෘෂිකාර්මික කටයුතුවල නිරත ව සිටිති. අපේ ප්‍රධාන ආහාරයට අවශ්‍ය ධාන්‍ය හා එළවළු නිෂ්පාදනය කරන්නේ එම ප්‍රදේශයේ ජීවත් වන්නන් ය.



මුහුදු බඩ තීරය ආශ්‍රිත ව ජීවත් වන්නෝ ප්‍රධාන වශයෙන් ධීවර කර්මාන්තයේ නියැළී සිටිති. රටේ ජනතාවට අවශ්‍ය මාළු සපයන ඔවුනගේ සේවය ඉතා වැදගත් කොට සැලකිය හැකි ය.



ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ සානු හා බෑවුම් සහිත ප්‍රදේශවල තේ වගා කරනු ලබයි. අපනයන භෝගයක් වන තේ විදේශයන්ට යැවීමෙන් අප රට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගනියි. වතුකරයේ ජීවත් වන ද්‍රවිඩ ජනතාවත් ඇතැම් සිංහල ජනයාත් තේ කර්මාන්තයේ නියැළී සිය ශ්‍රමය වැය කරති.

මේ අයුරින් අපේ රටේ ආර්ථිකයට දායක වන කර්මාන්ත රාශියක් ඒ ඒ ප්‍රදේශවල ඇති සම්පත් ආශ්‍රිත ව දියුණුවට පත් වී තිබේ. ඒ අතුරින් ප්‍රධාන කර්මාන්ත කිහිපයක් මෙසේ හඳුනා ගනිමු.

- උළු ගඩොල් කර්මාන්තය
- පිත්තල කර්මාන්තය
- පේෂ කර්මාන්තය
- මැණික් ආශ්‍රිත කර්මාන්තය
- මිණිරන් කර්මාන්තය
- කැටයම් කර්මාන්තය
- මැටි කර්මාන්තය
- වේවැල් කර්මාන්තය
- සම්භාණ්ඩ කර්මාන්තය
- පොල් ආශ්‍රිත කර්මාන්තය
- රබර් ආශ්‍රිත කර්මාන්තය
- පැණි, හකුරු කර්මාන්තය



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

## ක්‍රියාකාරකම 6.1.3.1


- ඔබේ ප්‍රදේශයේ ආර්ථික කටයුතුවලට එම ප්‍රදේශයේ සම්පත් යොදා ගන්නා ආකාරය හඳුනාගැනීමට ක්ෂේත්‍ර චාරිකාවක යෙදෙන්න. ප්‍රදේශයේ සිදුකෙරෙන විවිධ නිෂ්පාදන හඳුනාගෙන ඒවා ආශ්‍රිත රැකියා ලැයිස්තුගත කරන්න.
- ඔබ ප්‍රදේශයේ පවතින සම්පත් හඳුනාගන්න. දැනට ප්‍රයෝජනයට නොගන්නා සම්පත් ඔබේ ප්‍රදේශයේ ඇත් දැයි සොයා බලා, එම සම්පත් යොදාගෙන ආරම්භ කළ හැකි කර්මාන්ත පිළිබඳ ව ඔබේ මිතුරන් සමග සාකච්ඡා කොට පහත වගුව පුරවන්න.


| හඳුනාගත් සම්පත් | එම සම්පත් ප්‍රයෝජනයට ගෙන ආරම්භ කළ හැකි කර්මාන්ත |
|---|---|
| | |

## 6.1.4 ප්‍රදේශවාසීන්ගේ සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා

සමාජ සත්ත්වයකු වන මිනිසාට තනි ව ජීවත් වීම අසීරු ය. ඔහු හැම විට ම සෙසු අය සමග සම්බන්ධතා ගොඩනගා ගනිමින් ජීවත් වෙයි.

ඔබේ ප්‍රදේශයේ ජනතාව එකට එක් වී කටයුතු කරන අවස්ථාවන් ඔබ දැක ඇත. එවැනි අවස්ථාවල ඔවුන්ගේ සාමූහිකත්වය හා එකමුතු බව විශාල ශක්තියකි. තම ප්‍රදේශයේ ජීවත් වන අය අතර විවිධත්වයක් තිබිය හැකි ය. මෙම විවිධතා මධ්‍යයේ වුව ද එක් ව කටයුතු කිරීමට ඔබ පුරුදු පුහුණු විය යුතු ය. ආපදාවක දී ඔබට පිහිට වන්නේ අසල්වැසියන් ය. විවාහ මංගල්‍යයක දී අසල්වාසීහු එක් වී සතුටු වෙති. කෘෂිකාර්මික කටයුතුවල ද අන්‍යෝන්‍ය සහයෝගයෙන් යෙදෙති.


වහලක් සෙවිලි කරන මිනිසුන්


මංගල අවස්ථාවක එකිනෙකාට උදව් කරමින් වැඩ කරන පිරිසක්


මාර්ගයක ශ්‍රමදානයක්

## ක්‍රියාකාරකම 6.1.4.1

- ඔබේ නිවසේ හෝ අසල්වැසි නිවසක පැවැත් වූ උත්සව අවස්ථාවක දී ප්‍රදේශවාසීන් හා එක් ව කටයුතු කළ ආකාරය මිතුරන් සමඟ සාකච්ඡා කරන්න. එහි දී තමා හඳුනාගත් යහපත් ගුණාංග ලියා දක්වන්න.
- අසල්වැසියකුට විපතක්, කරදරයක් සිදු වූ අවස්ථාවක් ගැන සිතා එවැනි අවස්ථාවක ඔබ ක්‍රියාකරන්නේ කෙසේදැයි ලියා පන්තියට ඉදිරිපත් කරන්න.

## 6.1.5 ප්‍රදේශයේ සිද්ධස්ථාන, සමිති සමාගම්, ආයතන මගින් ඉටුවන සේවා

අතීතයේ සිට ම ජනතාව තමා අදහන ආගමට අයත් ආගමික ආයතන සමඟ නිරතුරු ව සබඳතා පැවැත්වූහ. ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා රාශියක් මෙම සිද්ධස්ථානවලින් ඉටු කරනු ලැබේ. ජනතාවට දහම් දැනුම ලබා දෙන්නේත්, සිරිත් විරිත්, ආචාරධර්ම පිළිබඳ වන ආකල්ප ලබා දෙන්නේත්, දැනුවත් බව ඇති කරන්නේත්, ආගමික සිද්ධස්ථාන මගිනි.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

කුමන ආගමකට අයත් සිද්ධස්ථානයකින් වුවත් ඉටුවන ප්‍රධාන ම කාර්ය වන්නේ මිනිසුන් යහපත් පුරවැසියන් බවට පත් කිරීමයි.

ආගමික සිද්ධස්ථාන මගින් ඉටුවන සේවා :-

- ❖ ආගමේ ආචාරධර්ම පිළිබඳ දැනුවත් කිරීම.
- ❖ පාලකයන්ට අවවාද අනුශාසනා ලබා දීම.
- ❖ දහම් පාසල් පවත්වාගෙන යෑම.
- ❖ මංගල අවමංගල කටයුතුවල දී විවිධ වූ ආගමික වතාවත් සිදු කිරීම.
- ❖ පොදු කටයුතුවල දී නායකත්වය ලබා දීම.
- ❖ ජාතික ආපදාවල දී ජනතාවට පිහිට වීම.
- ❖ අවශ්‍ය අවස්ථාවල දී ජනතාවට පිහිට වීම.

**ක්‍රියාකාරකම 6.1.5.1**

❇ ඔබ ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථාන මගින් ඉහත සේවාවන් ඉටු වූ අවස්ථාවන්ට උදාහරණ දක්වන්න.

## සමිති සමාගම්

ප්‍රදේශයේ ජනතාව තම පොදු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විවිධ සංවිධාන පිහිටුවා ගනිති. සුභසාධක සමිති, මරණාධාර සමිති, ගොවි සංවිධාන, ග්‍රාම සංවර්ධන සමිති, ක්‍රීඩා සමිති, ණය දෙන සමිති, ආගමික සංවිධාන ආදිය ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය. මෙම සංවිධානවල නිලධාරීහු හා සාමාජිකයෝ ස්වේච්ඡාවෙන් තම ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටු කිරීමට ඉදිරිපත් වෙති. පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය සුහදතාව, සහයෝගය වර්ධනය කිරීමට. පොදු ගැටලු සාමූහික ව විසඳා ගැනීමට, තම වැඩකටයුතු වඩාත් පහසුවෙන් ඉටුකර ගැනීමට මෙම සමිති සමාගම්වලින් විශාල මෙහෙයක් සැලසේ.

**ක්‍රියාකාරකම 6.1.5.2**

❇ ඔබ ප්‍රදේශයේ ජනතාව එකතු වී පිහිටුවා ගෙන තිබෙන සමිතියක හෝ සමාගමක පහත දැක්වෙන විස්තර රැස්කරන්න.

1. සමිතියේ හෝ සමාගමේ නම :-
2. පිහිටුවා ගත් වර්ෂය :-
3. පිහිටුවා ගැනීමේ අරමුණු :-
4. එමගින් ඉටුවන සේවාවන් :-
5. සාමාජිකයන් සංඛ්‍යාව :-
6. නිලධාරි මණ්ඩලය :-

## ප්‍රදේශයේ පවත්නා වෙනත් ආයතන

ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටු කිරීම සඳහා රජය හෝ වෙනත් සංවිධාන මගින් පිහිටුවා ඇති ආයතන ඔබ ජීවත් වන ප්‍රදේශයේ තිබේ. මෙම ආයතන මගින් ප්‍රදේශයේ ජනතාවට විවිධ වූ සේවාවන් සැපයේ. එවැනි ආයතන කිහිපයක තොරතුරු විමසා බලමු.

**ප්‍රාදේශීය සභාව**

- ❇ ජනතාවට අවශ්‍ය පොදු පහසුකම් සැපයීම.
- ❇ විදුලි පහසුකම් ලබා දීම.
- ❇ මාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීම
- ❇ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම
- ❇ අධ්‍යාපන පහසුකම් ලබා දීම.
- ❇ ප්‍රවාහන පහසුකම් ඇති කිරීම.

**තැපැල් කාර්යාලය**

- ❇ දේශීය හා විදේශීය ලිපි හා පාර්සල් බෙදා හැරීම.
- ❇ විදුලි පණිවිඩ ලබා දීම.
- ❇ මුදල් ඇණවුම් නිකුත් කිරීම.
- ❇ විශ්‍රාම වැටුප් ගෙවීම.
- ❇ දිළිඳු සහන මුදල් ගෙවීම.
- ❇ තැපැල් හැඳුනුම්පත් නිකුත් කිරීම.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

**ක්‍රියාකාරකම 6.1.5.3**

❉ ඔබ ප්‍රදේශයේ ඇති පොදු සේවා ආයතනවල තොරතුරු ඉහත උදාහරණවල දක්වා ඇති ආකාරයට ගොනුකරන්න.

## 6.1.6 අපට සහාය වන්නෝ

ඔබ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විවිධ සේවාවන් සැපයීම සඳහා සහභාගි වන රජයේ හා වෙනත් ස්වේච්ඡා ආයතනවල නිලධාරීන්ගේ කාර්යභාරයන් හඳුනා ගනිමු. ඔවුන් කිහිපදෙනකු පිළිබඳ විස්තර පහත දක්වේ.

### ග්‍රාමසේවා නිලධාරියා :-

ගම් මට්ටමේ සිටින රජයේ නියෝජිතයා වේ. ඔහුගේ කාර්යභාරය හඳුනා ගනිමු.

- රජයේ සහනාධාර අදාළ පුද්ගලයන් වෙත යොමු කරයි.
- ප්‍රදේශයේ සිදුවන අපචාර හා නීති විරෝධී කටයුතුවලට එරෙහි ව නීති මාර්ගයෙන් කටයුතු කිරීම
- කිසිවකුගේ අයිතිවාසිකමක් උල්ලංඝනය වූ අවස්ථාවක මැදිහත් ව ඒ පිළිබඳ ව සොයා බැලීම
- හැඳුනුම්පත් නිකුත් කිරීමට සහාය වීම.
- මැතිවරණ කටයුතු සංවිධානය
- ගම් වැසියන්ට ග්‍රාමසේවක සහතික නිකුත් කිරීම.
- මැතිවරණ කටයුතුවල දී ගම්වාසීන් පිළිබඳ අවශ්‍ය වන සංඛ්‍යා ලේඛන රැස් කිරීම.





මහජන සෞඛ්‍ය පරීක්ෂක

**මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගෙන් ඉටු වන සේවය**

- ❉ බෝවන රෝග පැතිර යෑම වැළැක්වීමට කටයුතු කිරීම
- ❉ පාසල් සිසුන්ගේ සෞඛ්‍ය කටයුතු පරීක්ෂා කිරීම
- ❉ වෛද්‍ය සායන හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ❉ සෞඛ්‍ය ආරක්ෂක උපදෙස් ලබාදීම
- ❉ එන්නත් ලබා දීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම



සමෘද්ධි නිලධාරියා

**සමෘද්ධි නිලධාරියාගෙන් ඉටුවන සේවය**

- ❉ සමෘද්ධි සහනාධාර ලබා දීමට කටයුතු කිරීම
- ❉ දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ❉ ගමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම



නොමිලේ බෙදාහැරීම පිණිසයි.



පවුල් සෞඛ්‍ය සේවිකාව

**පවුල් සෞඛ්‍ය සේවිකාවගේ කාර්යභාරය**

- ❈ මාතෘ හා ළමා සෞඛ්‍ය රැකගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම
- ❈ ළදරුවන් සඳහා විවිධ එන්නත් ලබා දීම
- ❈ පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- ❈ ප්‍රදේශයේ මාතෘ හා ළමා සායන පැවැත් වීම



පොලිස් නිලධාරියා

**පොලිස් නිලධාරියාගේ කාර්යභාරය**

- ❈ රජය පනවන නීති රීති ආරක්ෂා කිරීම
- ❈ සාමය රැකීම
- ❈ තම බල ප්‍රදේශයේ අපරාධ වැළැක්වීම
- ❈ හදිසි විපත්වල දී සහන සපයමින් සේවා සැලසීම



තැපැල්කරු

**තැපැල්කරුගේ කාර්යභාරය**

- ❈ ලිපි හා පාර්සල් බෙදීම
- ❈ විදුලි පණිවිඩ
- ❈ ඡන්ද පත්‍රිකා බෙදා හැරීම

## ස්වේච්ඡා සංවිධාන

- ❖ මරණාධාර සමිති
- ❖ ස.ණ.ස. සමිති
- ❖ කාන්තා සමිති
- ❖ ළමා සමාජ
- ❖ ආගමික සංවිධාන

### ක්‍රියාකාරකම 6.1.5.4

❈ ඔබට විවිධ සේවාවන් සපයන නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් සකස් කරන්න. ඔවුන්ගෙන් රටට වන කාර්යභාරය හඳුනාගෙන පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සේවා සපයන නිලධාරියා | ඔහුගෙන් ඉටු වන සේවය |
|---|---|
| | |

❈ ඔබේ ප්‍රදේශයේ ඇති සමිති සමාගම් කිහිපයක නම් ලියන්න. ඒවා මගින් ඔබ ප්‍රදේශයට ඉටු වන සේවාවන් මොනවා ද?



නොමිලේ බෙදාහැරීම පිණිසයි.